# තිරසර ජීවිතයකට විද්‍යාව

මහාචාර්ය සරත් කොටගම



## විද්‍යාවේ වත්මන් තත්වය

විද්‍යාව අද ලොව ජයගෙන ඇත. මෙම අදහස සත්‍ය වශයෙන්ම එසේද? ඉතාම මෑත කාලයක (2018 පෙබරවාරියේදී) විද්‍යාවේ වත්මන් තත්වය (State of Science) ගැන 3M සංගමය රටවල් 14ක් තුළ (සංවර්ධිත රටවල් අතර - කැනඩාව, ප්‍රංශය, ජර්මනිය, ජපානය, සිංගප්පූරුව, බ්‍රිතාන්‍ය සහ එක්සත් රාජධානිය. සංවර්ධනය වන රටවල් - බ්‍රසීලය, චීනය, මෙක්සිකෝව, ඉන්දියාව, පෝලන්තය, සෞදි අරාබිය, දකුණු අප්‍රිකාව) පවත්නා තත්වය ගවේෂණය කරන ලදී. මෙහිදී සංවර්ධිත හා සංවර්ධනය වන රටවල් අතරින්. පොදුවේ ලැබුණු ප්‍රතිඵලය නම්, විද්‍යාව ගැන බහුතරය සතුටු වන අතර, අලුත් දේ ගැන ඉගෙනීමට හැකි වීම ගැන උද්යෝගයක් දැක්වීමයි.

නමුත් මෙම ධනාත්මක අදහස් තුළ තරමක් කණස්සල්ලට හේතුවන අදහස්ද ඇත. බොහෝ වැඩිමහල් අය විද්‍යාව තම ජීවිතයට කර ඇති බලපෑමට වඩා තම දරුවන්ට අදාළ වනසේ බලපෑමක් ඇතිවනු දකියි. මේ අනුව දරුවන්ට විද්‍යාව දැනගැනීමට ඇති අවස්ථා ලබාදීමට ප්‍රබල ප්‍රයත්නයක් දරයි.

**1 වැනි වගුව: විද්‍යාවේ වත්මන් තත්වය**

A - Non – Skeptical (සැකරහිත)

B – Skeptical (සැක)

| | A | B |
|---|---|---|
| තාක්ෂණික වර්ධනය විද්‍යා වර්ධනයට වඩා වැදගත් | 23% | 50% |
| විද්‍යාව නොතිබුනානම්, මගේ දෛනික ජීවිතය එතරම් වෙනසක් නොවීමට තිබිණ | 16% | 40% |
| විද්‍යාව නොතිබුනානම් | 16% | 37% |
| විද්‍යාවෙන් රැකියාවන්ට යා හැක්කේ (geniuses) මොළය ඇති අයට පමණය | 14% | 31% |
| විද්‍යාව උද්යෝගමත් විෂයක් නොවේ (boring) | 12% | 41% |
| වැඩිහිටි / ව්‍යපත් වශයෙන්, විද්‍යාව ගැන අවබෝධයක් ලබාගැනීම වැදගත් නොවේ | 10% | 36% |

මෙම සමීක්ෂණය හරහා සොයා ගත් අදහස් සමහරක් නම් :-

- ■ තරුණ පරපුර විද්‍යාව ගැන යහපත් දැක්මක් දක්වන්නේ නැති අතර විද්වතුන් සොයන දේ ගැන වැඩි විශ්වාසයක්ද පෙන්වන්නේ නැත.
- ■ විද්‍යාව අවතක්සේරුවට හා නොපෙනෙන දෙයක් සේ බොහෝදෙනා දකියි.
- ■ 90% තාක්ෂණය ගැන සුභවාදීව අනාගතයට දකින අතර තම ජීවිකාවට උපකාරකවන බව විශ්වාස කරයි.
- ■ 87% විද්‍යා ප්‍රතිඵල විශ්මය ජනකසේ දකියි.
- ■ 86% විද්‍යාව ගැන කිසිවක් නොදන්නා අය විය.
- ■ 90% විද්‍යාව නිර්මාණකරණයට මෙවලමක් සේ දකියි.
- ■ 23% විද්‍යාව හා තාක්ෂණය සම්පූර්ණයෙන් වෙනස් හැටියට සිතයි.

බහුතරයක් විද්‍යාව වැදගත් සේ සිතුවත්, එය ඒ අයගේ දෛනික ජීවිතයට එතරම් වැදගත් නොවන බවත්, විද්‍යාව ගැන සිතන්නේවත් නැති බවත් සමීක්ෂණයෙන් ඉස්මතු විය.

මෙවැනි තොරතුරු අතර බොහොමයක් විද්‍යාව ගැන සැක සහිතව බැලීම ඉතාම ප්‍රබල ප්‍රශ්නයක් සේ දකිය හැක.

විශාල තරුණ පරපුරක් විද්‍යාව

ගැන ඉතාම සැකයෙන් බැලීමද ඉතාම වැදගත් කරුණකි.

මෙවැනි පසුතලයක් තුළ තිරසර ජීවිකාවකට විද්‍යාව කොතරම් වැදගත් වේද යන්න උරගා බැලීම ඉතාම කාලෝචිතය. ලංකාව තුළ පවතින ආකල්පය කුමක්ද? මෑත කාලයේ විද්‍යා ඉගෙනුමට අඩු ශිෂ්‍ය ප්‍රවණතාවයන් පෙන්වීම, පසුතල පදනමක් හැටියට ගතහොත් අනාගතය ඉතාම අඳුරුවීම නොඅනුමානය. තිරසර ජීවිකාවක පදනම සඳහා අත්‍ය අවශ්‍යම පසුතලයකි 'විද්‍යාත්මක සිතුවිල්ල'. මේ අනුව 'තිරසර ජීවිකාවකට විද්‍යාව' ඉටුකරවා ගැනීමට නම් විද්‍යාව පැහැදිලිව ප්‍රචලිත කිරීම ඉලක්ක කරගත යුතුය. තිරසර ජීවිකාවේ වත්මන් පදනම වටහා ගැනීමට "පරිසර ප්‍රශ්නය" වටහා ගැනීම අවශ්‍ය වේ. මේ අනුව පරිසර ප්‍රශ්නයේ විකාශය ආරම්භයේ සිට වැදගත් අවධි ඔස්සේ අවබෝධ කර ගනිමු.




## පරිසර තත්ව විකාශය

1960 මුල් භාගයේදී ලොවට ආහාර අහේනියකට මුහුණ දීමට සිදුවිය. මෙම අවස්ථාවෙන් ගොඩ ඒම සඳහා, කෘමිනාශක, (ජීවනාශක) හා රසායනික පොහොර යෙදීම හරහා ආහාර නිෂ්පාදනය වැඩිකර ගන්නා ලදී. ආහාර අහේනිය බොඳ වී ගියත්, අලුත් ක්‍රමවේද ලෙසට "යෙදුම් කෘෂිකර්මය" ස්ථාපිත විය. සෑම භෝගයක්ම වගා කරන්නේද, එය රැකගැනීමට, එනම් පළිබෝධකයින්ගෙන්, රැකගැනීමට පළිබෝධනාශක යෙදූහ. ඵලදාව වැඩිකර ගැනීමට පෝෂණය සැපයීම පොහොර මගින් සිදුවිය. විද්‍යාත්මකව මෙම ක්‍රම ප්‍රගුණ කළ අතර අවශ්‍ය නිපයුම වැඩිකර ගැනීමට තව තවත් විද්‍යාත්මක ක්‍රමවේද අත්හදා බැලූහ. විද්‍යාව යොදා ගැනීම මෙහිදී ප්‍රධාන කාර්යයක් විය. විද්‍යානුකූලව 'තරඟ කරුවන්' 'හානිකරුවන්' ඉවත් කිරීම හා 'අමතර පෝෂණය' ය ලබාදීමෙන් ඵලදාව වැඩිකර ගත හැකි බව තහවුරු විය. කල්යත්ම වැඩිවන ජනගහනයට සරිලන ඵලදාවක් නොලැබීම හේතුවෙන්, විකල්ප ක්‍රම ලෙස, ශාක / සතුන්ගේ ප්‍රගුණ ලක්ෂණ හඳුනාගෙන ඒවා තවත් ප්‍රගුණ කිරීම ආරම්භ විය. සරල දෙමුහුම් ක්‍රියා ඔස්සේ 'ජීව විකෘතීන්' (Living Modified Organisms - LMOs) හා අවසානයේදී "ප්‍රවේණි විකෘතීන්" (Genetically Modified Organisms - GMO) හරහා අවශ්‍යතාව ඉටුකර ගැනීම සිදුවිය. මෙම හැම අවස්ථාවකම ප්‍රධාන 'දිරිමග' වූයේ විද්‍යාවයි. LMO හා GMO වලට සමහරු විරුද්ධ වුවත්, මෙම ක්‍රම හරහා සමහර භෝග වගාවේදී, වැඩි අස්වැන්න හා වෙළඳපොලේ පහසුවට හිතකර ලක්ෂණ වර්ධනය කර ඇත. මේ අතර කල් තබාගැනීම, පෙනුම, රස හා ස්වරූප වෙනස්ද වේ. අද ප්‍රධාන භෝග අතර - තිරිඟු, හා සොයාවලින් 95% පමණ නිපදවන්නේ GMO ශාක හරහාය. අහේතුවකට ආර්ථික ලෝකයේ 'ඒකාධිපතිත්වය' ලබාගැනීමට මෙම තාක්ෂණ උපයෝගිතා සමත් වී ඇත. මේ අනුව අද වන විට ලෝකයේ ප්‍රධාන භෝග නිෂ්පාදනය ඔවුන් නතු කරගෙන ඇත.

මෙම කෘෂි ගමන හරහා ආහාර නිපයුම ප්‍රගුණ කරගත හැකි වුවත්, මෙම යෙදුම්වලින් විශාල හානිකර තත්වයන්ද උදාවී ඇත. වසර 1963 රැචල් කාසන් මහත්මිය හඳුනාගත් "ලොව විෂ වීම" අද යථාර්ථයක් බවට පත්වී ඇත. කෘෂි ද්‍රව්‍ය නිසා විවිධාකාර බෝනොවන රෝග ඉස්මතු වී ඇති අතර පරිසරයද විනාශවී ඇත. මෙයට සමගාමීව මිනිසාගේ ජීවන විලාශයද වේගවත්ව වෙනස් වී ඇත. මෙම වෙනස්කම්වලට ප්‍රධාන දායකය තාක්ෂණික උපයෝගී වීම බව නොරහසකි.

මානව ජීවිකාව වෙනස් වීම, ඔහුගේ සාර්ථකත්වය යැයි පැහැදිලිව ඉදිරිපත් කිරීමට කොතෙකුත් උත්සාහ දැරුවද, ඒ ක්‍රියාවලිය හරහා 'පරිසරයට' උරුම වී ඇති තත්වය දෙස බැලූ විට එය






විශාල ප්‍රශ්නයක් බවට පත්ව ඇත. වත්මන් පරිසර ප්‍රශ්ණ උරගා බැලීමේදී ඒවාට පිළියමක් සේ වසර 1992 දී පිළිගත්තේ 'තිරසර සංවර්ධනය' හරහා තිරසර ජීවිකාවක් කරා ගමන් කිරීම යෝජනා විය.

මෙම පසුබිම තුළ සම්පින්ඩනය වන කරුණු දෙකකි. එකක් විද්‍යාව ලබා දී ඇති දායකත්වයයි. දෙවන්න ඇතිකර ගෙන තිබෙන පරිසර ප්‍රශ්ණයි. සමහරු විද්‍යාව මෙම ප්‍රශ්ණවලට මුල සේ තර්ක කළ හැක. එසේ වුවත් විද්‍යාව හුදෙක් අදහස් හා දැනුම උරගා බලන පිළිගත හැකි පිළිවෙතක් පමණි. එහිදී එම විද්‍යා දැනුම යෙදීම අප පොදුවේ හඳුන්වන්නේ 'තාක්‍ෂණය' ලෙසයි. මේ අනුව තර්ක කිරීම තුළ විද්‍යාව නොව තාක්‍ෂණය මෙම අහිතකර පරිසර තත්වයට හේතු බව බොහෝදෙනාගේ පිළිගැනීමයි.

මේ අනුව වත්මන් පරිසර ප්‍රශ්ණයේ හේතු සෙවීමට ප්‍රයත්න දැරීමේදී අපට පහත සඳහන් නිගමනවලට ඒමට සිදුවේ. ප්‍රශ්ණයක් සඳහා, **ආසන්න** හා **අවසාන** හේතු සාධක ඇත. මේ අනුව පරිසර ප්‍රශ්ණයේදී **ආසන්න හේතු සාධක වශයෙන් ජනගහනය, තාක්‍ෂණය, වෙළඳ ආර්ථික ක්‍රමවේදය** හා **බැඳුනු වෙළඳ ප්‍රචාරක ක්‍රම** ලෙස හඳුනාගත හැක. මේවාගේ බලපෑම ඇතුව **අවසාන හේතු සාධකය** ලෙස සලකන්නේ **'පරිභෝජනයයි'**. වෙළඳ ක්‍රම හා ආර්ථිකය අපව 'පරිභෝජනයට' පොළඹවයි. මේ හරහා ජීවන රටාවල්වල පැහැදිලි වෙනසක් ඇති කර තිබේ. පොදුවේ සංවර්ධිත ලෝක ජනගහනය වන 20%, සම්පත්වලින් 80% පරිභෝජනය කරයි. සංවර්ධනය වන දේශවල ජනගහනය වන 80% සඳහා ඉතිරිව ඇත්තේ සම්පත් 20% පමණි. සංවර්ධනයවන ජනයාගේ අභිප්‍රාය සංවර්ධිත ජනයාගේ - (20%) ජීවන රටාව කරා යෑමයි. මෙය පරිසරයට විනාශයක් නොවී සිදුවිය හැක්කක් නොවේ. මේ වන විටත් ලෝක 'පරිසර පා සටහන් ' සේ සලකන ඉන්දිසියට අනුව, අපි 1.5 තැනක සිටී. මෙයින් අදහස් වන්නේ වර්තමාන ජනගහනය ලෝක සම්පත් 1.5 ක් එනම් 0.5 අභිබවා පරිභෝජනය කරන බවයි. අප ජීවන රටාව නොවෙනස්ව ඉදිරියට ගෙන ගියහොත් වසර 2030දී මෙය 3 වන බව ඇස්තමේනතු කරයි. එය කොහෙත්ම මිහිතලයට දරාගත හැකි පාරිසරික තත්වයක් නොවේ. මේ නිසාම 'තිරසර ජීවන රටාව' මිහිතලයේ මානවයාගේ පැවැත්මට අනිවාර්යවේ. එසේ නොවන්නේ නම් මිහිතලය විනාශය වීමට පෙර අප විනාශය කරා පැහැදිලිවම ගමන් කරනු ඇත.

පරිසර ප්‍රශ්ණය වටහා ගැනීමත් සමග වසර 1992 දී අප වෙනත් සංවර්ධන මගක් යෑමට තීන්දු කරන ලදී. මෙය ඉටුකර ගැනීමට තවමත් අසමත් වූවත්, එදාටත් වඩා දැඩි අවශ්‍යතාවක් අද ඇත. වසර 1992 රියෝඩි ජනාරෝ නගරයේදී අපි 'තිරසර සංවර්ධන' න්‍යාය පත්‍රය 'Agenda 21' ලෙස අනුමත කරන ලදී. එසේ වුවද වසර 2012 නැවත රියෝඩි ජනාරෝ නගරයේදී මෙම 'තිරසර සංවර්ධන' ක්‍රියාවලිය ආයතන ගත කළ යුතු යයි තීන්දු විය. මේ අතර වසර 2003දී එළි දක්වූ 'සහස්‍ර පරිසර පද්ධති' (Millennium Ecosystem Assessment) ඇස්තමේන්තුවේ මිහිතලයේ 'සෞඛ්‍ය' (Health) තත්වය පෙන්වාදුන්නේ ඉතාම භයානක දෙයකි. මාපක 38න් එකක්වත් යහපත් නොවීමයි. මෙය පාදක කරගෙන 'සහස්‍ර සංවර්ධන ඉලක්ක' අනුව 2015 වන තෙක් උත්සාහ දැරුවද, එයත් පොදුවේ අසාර්ථක විය. වසර 2015 අප නව තිරසර සංවර්ධන ඉලක්ක 17 - කරා යන ගමනක් ආරම්භ කරන ලදී. මෙහි ප්‍රධාන අදහස් වන්නේ "හැමදෙනාම ඇතුළත්ව" (all inclusive) 'කිසිම කෙනෙක් අත් නොහැර' (leaving no one behind) ඉදිරියට තිරසර ජීවිකාවක් ඔස්සේ ගමන් කිරීමයි.



මෙම තිරසර ජීවිකා ගමන මේ අනුව ඉටුකර ගැනීමට නම්, තිරසර සංකල්ප හතරක් මුල් විය යුතුය.

1. වත්මන් පරම්පරාවෙහි අවශ්‍යතා සපුරන අතර අනාගත පරම්පරාවන්ගේ අභිප්‍රායන්ට අවකාශ ලබාදීම.
2. තිරසර සංවර්ධනය හරහා ස්වභාවික සම්පත් වන - වායුගෝලය,




ජලය, පාෂාණ හා ජීවීන්ගේ පැවැත්මට හානියක් හෝ අනතුරට පත් නොවිය යුතුය.

3. තිරසර සංවර්ධනය ඉටුකර ගැනීමට පරිසර පද්ධතිවලට හානියක් නොවන ආකාරයට සම්පත් උකහාගත යුතුය.

4. තිරසර සංවර්ධනය වත්මන් පරම්පරාවන්ගේ වර්ධනයට රුකුලක් වන ආකාරයට පරිසරය රැකගනිමින් ක්‍රියා කළ යුතුය.

මේ සංකල්ප ඔස්සේ සම්පත් රැකගැනීම හා පරිසර පද්ධති හානි නොකර තබාගැනීම ප්‍රමුඛ කාර්යක් වන්නේය. මෙම මූලික අදහස් පදනම් කරගෙන ස්වීඩනයේ දොස්තර Karl Herik Robert 'හතර පද්ධති කොන්දේසි' නිර්මාණය කර ඇත. මේ අනුව;

1. මිහිතලයේ පෘෂ්ඨයෙන් උකහාගන්නා හෝ කනින ලබන ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණය වැඩිකර නොගත යුතුය.

2. මානව සමාජය, කෘතිම ද්‍රව්‍යවලින් සන්තෘප්ත නොවිය යුතුය.

3. භෞතික (Physical) ක්‍රමවේද මගින් ස්වභාවිකත්වය හානියට ලක් නොකළ යුතුය.

4. මිනිසුන්ගේ මූලික අවශ්‍යතා (Needs) ඉටුකර ගැනීමට ඇති අවස්ථා හා අවධි ක්‍රමිකව සීමාවන ආකාරයේ කටයුතු නොකළ යුතුය.

මේ අදහස් වලට අමතරව ආර්ථික විද්‍යාඥ Heman E. Daly 'ඩේලිගේ ප්‍රතිපත්ති තුන' වශයෙන්ද අදහස් ඉදිරිපත් කර ඇත.

1. නව්‍ය කළ හැකි (Renewable Resources) සම්පත් වන පස, ජලය, වනාන්තර හා මසුන් යනාදියගේ තිරසර පරිහරණ ප්‍රවේගය ඒවායේ ස්වභාවික ප්‍රතිවර්ධන වේගයන් අබිබවා නොයා යුතුය.

2. නව්‍ය කළ නොහැකි (Non – renewable) සම්පත්වල තිරසර පාවිච්චිය, නව්‍ය කළ හැකි සම්පත්වල ආදේශ වේගය අභිබවා නොයායුතුය.

3. කසළ නිෂ්පාදනය කිසිවිටක ඒවායේ ස්වභාවික පෘථක්කරණ (බිඳවැටීමේ) වේගය අබිබවා නිෂ්පාදනය නොවිය යුතුය.

තිරසර සමාජයක, පදනමට මෙවැනි වැදගත් අදහස් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වුවද තිරසර ජීවනාලියක ඉටු වී ඇද්ද යන්න ගැටළුවකි.

ආර්ථික සංවර්ධනයෙන් ප්‍රබලම රට වන එක්සත් රාජධානියේ සමාජ අසමතාවයන් අවබෝධ කරගතහොත් 'ආර්ථික වර්ධනය' කොතරම් මායාකාරිද යනු වැටහෙනු ඇත. Stanford Center on Poverty and Inequality (2018) වාර්තාවේ සඳහන් සමහර විස්තර මෙයට සාක්ෂි දරයි:-

1. වේතන අසමතාව - ගතවූ වසර 30 තුළදී වේතන අසමතුලිතතාවය විශාල වශයෙන් වර්ධනය වී ඇත.

2. ආයතන ප්‍රධානීන්ගේ වේතන (CEO Pay) - වසර 2009 වන විට ආයතන ප්‍රධානීන්ගේ වේතනය, අත් වැඩකරන්නන්ගේ වේතනයට වඩා 185 ගුණයකින් වැඩි කර ඇත.

3. නිවාස නැතිකම (Homelessness) - දිනකට වැසියන් 750,000කට පමණ.

4. රැකියා තත්ව - පිරිමි අය වැඩි වේතන ලබන රැකියාවල නිරතවේ.

5. පාසැල් යෑම - කළු ජාතිකයන් අතර වැඩි පිරිසක් පාසැල් හැර යයි. හිස්පැනික් අය මිටත් වැඩිය. පාසැල්වලට ඇතුල්වීමේදීද සුදු ජාතිකයන් අන්ජාතීන් අබිබවයි.

6. ළමා දරිද්‍රතාවය - 21% (ලෝකයේ පොහොසත් රටවල වැඩීම ප්‍රමාණය)

7. ධන අසමතාව - ඉහළ පෙළේ 10% දෙනා එම රටේ මූල්‍ය සම්පතින් 68.2% පාලනය කරයි (1983). (5% ප්‍රමාණයක් - 59%, ද පහළ ජන කොටසක් 40% - මූල්‍ය සම්පත් 9% උරම කියයි.) වසර 2007 වන විට ඉහළ පෙළේ අයගේ වත්කම 73.1% දක්වා වැඩිවිය.

8. හිරගත වීම - වසර 2008 වන විට ඇමරිකානු කළු ජාතිකයන්ගෙන් 37% පමණ හිරගත වී ඇත. තවමත් මෙවන් සංඛ්‍යා ලේඛණවලින් මෙම අසමතුලිතය පෙන්වයි.

මේ අනුව වර්තමාන ආර්ථික ආකෘතිය යටතේ සිදුවන සංවර්ධනය නැවත සිතීම ඕනෑතරම් දැනුම ඇතත්, අප ඇස්බැඳුමකින් වසා ගෙන ඉදිරියට ඒ ආකාරයෙන්ම ගමන් කරයි. මෙම






ප්‍රවණතාවයට පටහැනිව නැගී එන රැල්ල "තිරසර සංවර්ධනය හා ජීවන රටාවයි".

තිරසර ජීවන රටාවේ ප්‍රධාන කරුණක් වන්නේ තමාගේ 'පරිසර පා සටහන' (Ecological Foot Print) (බලපෑම) ශුන්‍ය (Zero) අගයක තබා ගැනීම මෙහි ප්‍රධාන අරමුණයි. මෙය විශාල අභියෝග යකි. අප හැදෙන වැඩෙන ආකාරය, සහ අපව පෙළඹවන ප්‍රධාන ආර්ථික ක්‍රමය නිසා අසීමිත වර්ධනයක් සීමිත ලොවක් තුළ බලාපොරොත්තු වේ. මෙය කිසිවිට සිදුවිය නොහැකි බව දැන් ආර්ථික විද්වතුන් පිළිගනී. එම නිසා නව න්‍යාය හොයමින් 'හරිත ආර්ථික' ප්‍රවේශ ගැන කතා කරයි. ජීවන රටාව 'තිරසර නොකර' මොන න්‍යාය ගෙනාවත් ප්‍රශ්ණය විසඳෙනු නොමැත. මෙහිදී විද්‍යාව ප්‍රධාන ස්ථානයක් ගනී. 'පිළිගත් තර්ක අනුව දැනුම' හැම අතින්ම තිරසර ජීවන රටාවටත්, තාක්ෂණික උපයෝගීතා සඳහාත් ආර්ථික විෂය වර්ධනයටත් සෘජුව බලපායි.

බොහෝ දෙනාගේ තර්කය වන්නේ මෙම ආර්ථික ක්‍රමවේදය තුළ සිට මෙම ගමන යෑමටය. නමුත් මෙය කිසිසේත්ම ඉටුවිය හැකි කරුණක් සේ පරිසර විද්‍යාව පෙන්වාදෙයි. සමාජ සාධාරණත්වය (එනම් අසමතාව පිටු දැකීම) ප්‍රධාන වන්නේ නම්ද; එය ඉටු විය නොහැකි බව වත්මන් ආර්ථික සංවර්ධනයම සාක්ෂි දරයි. වසර 2017 දී වත්මන් පාප්තුමාගේ අදහස් ගොනුකර 'තිරසර සංවර්ධන ඉලක්ක කරා වැඩසටහනක්' යන තේමාව යටතේ ප්‍රකාශ කර ඇත්තේද මෙයයි. මෙම ප්‍රකාශ Laudatsisi ලෙස සඳහන් වන අතර, ඔහු ඉතා පැහැදිලිව මෙසේ ප්‍රකාශ කරයි.

"However, Special the SD4 rely on economic growth to end poverty Laudatsisi eriticises the concept of 'infinite or unlimited growth …. It is based on the lie that there is an infinite supply of the earth's goods, and this leads to the planet being squeezed dry beyond every limit" (LS 106)

(තිරසර සංවර්ධන හරහා දුප්පත්කම අවසන් කරන්නට ආර්ථික වර්ධනය මත යැපෙයි.... මෙය විවේචනය කරමින් කියා සිටින්නේ බොරු අදහසක් වන මිහිතලයේ ඕනෑතරම් සම්පත් ඇතැයි යන්න මතය. මේ ආකාරයට ඉදිරියට ගියහොත් මිහිතලය උරා වියළි කරණු ඇත.



වත්මන් තත්වය යටතේ විද්‍යා - මූලධර්ම අනිවාර්යයෙන් තිරසර ජීවිකාවට අවශ්‍යය. මේ වැටහීමම පරිසර ව්‍යසනයෙන් ගොඩ ඒමට ප්‍රමාණවත් වන බව නොරහසකි. එම ස්ථානයට නොයන්නේ මන්දයත් දැවෙන ගැටලුවයි.



කොළඹ 03
කොළඹ විශ්ව විද්‍යාලයේ
සත්ව විද්‍යා හා පරිසර විද්‍යා
දෙපාර්තමේන්තුවේ
**මහාචාර්ය සරත් කොටගම**